ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ

වාර්ෂික වාර්තාව 2020



ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

114/9, විජේරාම මාවත

කොළඹ 07,

ශ්‍රී ලංකාව

අන්තර්ගතය

දැක්ම 3
මෙහෙවර 3
ඉලක්ක 3
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අරමුණු 4
සභා පාලක මණ්ඩලයේ සාමාජිකවරු - 2020 5
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය 9
සභාපතිවරයා ගේ වාර්තාව 10
ලේකම්වරයා ගේ වාර්තාව 12
2020 වසර තුළ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ක්‍රියාකාරකම් 14
කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය 22
විද්‍යාඥවරුන් අභිප්‍රේරණය කිරීම 26
අරමුදල් සැපයීම 27
මානව සම්පත් සංවර්ධනය 29
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ප්‍රකාශන - 2020 32
තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම -2020 33
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කාර්ය මණ්ඩලය 36
කෘතඥතාව 39

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය සහතික කෙරෙන සුපැහැදිළි හා තිරසාර කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන පද්ධතියක්

මෙහෙවර

ප්‍රතිපත්ති සැකසීම, සුසාධ්‍යකරණය, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා අගැයීම සහ බලපෑම් තක්සෙරුව හරහා ජාතික සංවර්ධන ඉලක්ක වෙත කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදන යොමු කිරීම පිළිබඳ ව සහතික වීම

ඉලක්ක

1 වන ඉලක්කය: කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නවෝත්පාදනය ජාතික සංවර්ධන ඉලක්ක වෙත දිශානති කිරීම

2 වන ඉලක්කය: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ ධාරිතා බල සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

3 වන ඉලක්කය: ලෝක සම්මානනීය පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන තත්ත්වය සාක්ෂාත් කරගැනීම

4 වන ඉලක්කය: රේඛීය නියෝජිතායතන තුළ අඛණ්ඩ කාර්යසාධන අගැයීම ප්‍රවර්ධනය කිරීම

5 වන ඉලක්කය: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන ව්‍යාප්තිකරණය හා දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම

6 වන ඉලක්කය: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියට සේවා සැපයීම් වස් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනයික ධාරිතා බලය ශක්තිසම්පන්න කිරීම

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අරමුණු

1. කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධනය හා නව්‍යකරණයන් හී විශිෂ්ටත්වය ළඟා කරගැනීම
2. ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සාක්ෂාත් කරගැනීම සඳහා කෘෂිකාර්මික පර්යේෂණ හා නව්‍යකරණයන් නැඹුරු කිරීම
3. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ හා නවෝත්පාදන පද්ධතියේ (විද්‍යාත්මක හා තාක්ෂණික) ධාරිතාව වැඩිදියුණු කිරීම.
4. කෘෂිකාර්මික සංවර්ධනයට සහාය වීම සඳහා ඉහළ ප්‍රමිතීන් පිළිබඳ ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
5. ලෝක මට්ටමේ පර්යේෂණ, සංවර්ධන හා නව්‍යකරණයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර, කලාපීය සහ ජාතික මට්ටමේ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම
6. ජාතික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන වැඩසටහන් සහ ආයතනවල ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම
7. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන වැඩසටහන් ව්‍යාප්ත කිරීම හා දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම
8. ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම

සභා පාලක මණ්ඩලයේ සාමාජිකවරු - 2020

1. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සභාපති මහාචාර්ය ගාමිණි සේනානායක මැතිතුමා

2. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා මැතිතුමා

3. මුදල් අමාත්‍යාංශයේ, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පී. ජී. එස්. එච්. කුමාර මැතිතුමා

4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. වීරකෝන් මැතිතුමා

5. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, අතිරේක සංරක්ෂණ ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන), ආචාර්ය කේ.එම්. ඒ.බණ්ඩාර මැතිතුමා

6. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි මැතිතුමා

7. ගන්නෝරුව, පශු පර්යේෂණ ආයතනයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පශු පර්යේෂණ), පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන මහත්මිය

8. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආර්ථික විද්‍යාඥ චිත්‍රාල් ජයවර්ධන මැතිතුමා

9. තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය එල්.එස්.කේ.හෙට්ටිආරච්චි මැතිතුමා

10. වැවිලි අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජේ. එම්. ටී. ජයසුන්දර මහත්මිය

11. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ලේකම්/ අධ්‍යක්ෂ ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා

සභා පාලක මණ්ඩලයේ රැස්වීම් සඳහා සාමාජිකවරුන් පැමිණීම

අංකය	නම	226 වන රැස්වීම 27.02.2020	227 වන රැස්වීම 21.05.2020	228 වන රැස්වීම 16.06.2020	229 වන රැස්වීම 21.07.2020	230 වන රැස්වීම 18.08.2020	231 වන රැස්වීම 15.09.2020	232 වන රැස්වීම 20.10.2020	233 වන රැස්වීම 15.12.2020
1	මහාචාර්ය ගාමිණි සේනානායක	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
2	ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
3	ආචාර්ය කේ.එම්. ඒ.බණ්ඩාර	පැමිණියේ නැත	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේ නැත
4	පශු වෛද්‍ය ජී. ඒ. ගුණවර්ධන	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියේ නැත	පැමිණියේ නැත
5	ආචාර්ය ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. වීරකෝන්	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේ නැත
6	ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
7	පී. ජී. එස්. එච්. කුමාර මහතා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේය
8	ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේය
9	චිත්‍රාල් ජයවර්ධන මහතා	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය	පැමිණියේය
10	ආචාර්ය එල්.එස්.කේ.හෙට්ටිආරච්චි	X	X	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේ නැත	පැමිණියේ නැත	පැමිණියේය	පැමිණියේය
11	ජේ. එම්. ටී. ජයසුන්දර මහත්මිය	X	X	පැමිණියාය	පැමිණියේ නැත	පැමිණියාය	පැමිණියාය	පැමිණියාය	පැමිණියේ නැත

X පත් නොවීය

සභා පාලක මණ්ඩලයේ රැස්වීම් - 2020

2020 වර්ෂය තුළ පාලක සභා රැස්වීම් අටක් පවත්වන ලදී. 2020 වසරෙහි දී සභා පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස මහාචාර්ය ගාමිණි සේනානායක මැතිතුමා කටයුතු කළේ ය. 2020 වසරෙහි දී පාලක මණ්ඩලයේ ලේකම්/ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේ ප්‍රභාත් විමල් කුමාර මැතිතුමා ය.

විගණන හා කළමනාකරණ කමිටුව -2020

2020 වර්ෂය තුළ ප්‍රතිපත්ති සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව (AMC) විසින් මූල්‍ය හා පරිපාලනමය කරුණු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් දෙකක් පවත්වන ලදී.

නම	ආයතනය	60 වන රැස්වීම 20.07.2020	61 වන රැස්වීම 22.12.2020
පී. ජී. එස්. එච්. කුමාර මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය	පැමිණියේය	පැමිණියේය
ආචාර්ය එස්. එච්. එස්. අජන්තා ද සිල්වා	අතිරේක ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය	පැමිණියේය	පැමිණියේය
ආචාර්ය එච්. එම්. පී. කිත්සිරි	අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය	පැමිණියේය	පැමිණියේය
උදේනි පෙරේරා මහත්මිය	විගණන අධිකාරී, කෘෂිකර්ම, ගොවිජන මණ්ඩලය	පැමිණියේය	පැමිණියේය
යූ. එස්. එල්. කුමාර මහතා	අභ්‍යන්තර විගණක, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය	පැමිණියේය	පැමිණියේය

හැඳින්වීම

1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත බලාත්මක කිරීමත් සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ 1987 දෙසැම්බර් 22 වන දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව(SLCARP) පිහිටුවනලදී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය (NARS) තුළ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ක්‍රියාකාරී සහයෝගීත්වය ලබා දීම සභාව මඟින් ඉටු විය. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මඟින් කෘෂිකාර්මික අංශයේ පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය වේ. ප්‍රතිපත්ති සභාවේ ප්‍රධාන කාර්යයන් වනුයේ පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගැනීම, අදාළ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම තුළින් අන්තර්-ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, පර්යේෂණයන්හි ඇති බාධක නිරාකරණය කිරීම සහ අදාළ කමිටුවල ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා කාර්යභාරයක් ඉටුකිරීමයි. මේ වන විට සභා පාලක මණ්ඩලය විසින් පිහිටුවන ලද ජාතික කමිටු 12 ක් ඇත:

i. කෘෂිකාර්මික ජෛව තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව (NCAB),
ii. කෘෂිකාර්මික යාන්ත්‍රිකරණය පිළිබඳ ජාතික කමිටුව (NCAM),
iii. ජලජ සම්පත් පිළිබඳ ජාතික කමිටුව (NCAR),
iv. මල් වගා පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව (NCFRD),
v. වන විද්‍යා පිළිබඳ ජාතික කමිටුව (NCF),
vi. පශු සම්පත් හා කුකුළු පාලනය පිළිබඳ ජාතික කමිටුව (NCLP),
vii. ස්වාභාවික සම්පත් කළමනාකරණය, තිරසාර කෘෂිකාර්මික හා දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික කමිටුව (NCNRMSACC),
viii. කාබනික කෘෂිකර්මය පිළිබඳ ජාතික කමිටුව (NCOA),
ix. භෝග වැඩිදියුණු කිරීම හා සශ්‍ය විද්‍යාව පිළිබඳ ජාතික කමිටුව (NCPB),
x. ශාක ආරක්ෂණය පිළිබඳ ජාතික කමිටුව (NCPP),
xi. පශ්චාත් අස්වනු තාක්ෂණය හා මානව පෝෂණය පිළිබඳ ජාතික කමිටුව (NCPHTHN),
xii. සමාජ-ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ ජාතික කමිටුව (NCSEPA),

මෙයට අමතරව, විශේෂිත විද්‍යාත්මක සේවාවන් සඳහා විශේෂ විද්‍යාත්මක කමිටුපත් කරනලදී;
i. ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාව පිළිබඳ සංස්කාරක මණ්ඩලය
ii. පර්යේෂණ දීමනාව පිළිබඳ අනුකමිටු

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය

1. කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානය කිරීම, සම්බන්ධීකරණය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන වෙනත් අදාළ කරුණු පිළිබඳව රජයට උපදෙස් දීම;
2. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම;
3. ජාතික සංවර්ධන අරමුණු තව දුරටත් ඉදිරියට ගෙන යාමේ අරමුණින් කෘෂිකාර්මික පර්යේෂණ වල සමස්ත අරමුණු හා විෂය පථය නිර්වචනය කිරීම;
4. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන හා සංස්ථාපන වලට අවශ්‍ය මූල්‍ය, මිනිස් බල හා භෞතික සම්පත් සහ එම ආයතන වල සහ සංස්ථාපන වල කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි පිළිබඳ සුදුසු බලධාරීත්වයනට නිර්දේශ ඉදිරිපත් කිරීම;
5. ආයතනික හා දෙපාර්තමේන්තු කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් සමාලෝචනය කිරීම සහ ඒවායේ ප්‍රමුඛතා සහ අරමුදල් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන විෂයයභාර අමාත්‍යවරයා ගේ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම;
6. කෘෂිකාර්මික පර්යේෂණ වල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැපයීම;
7. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සහ රජය අතර සන්නිවේදන මාර්ගයක් ලෙස ක්‍රියාකිරීම;
8. අන්තර්-ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීම;
9. සමස්ත කෘෂිකාර්මික පර්යේෂණ අංශය සඳහා විශේෂ විද්‍යාත්මක සේවාවන් සංවිධානය කිරීම හා අරමුදල් සැපයීම;
10. ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම;
11. කෘෂිකාර්මික පර්යේෂණ වලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර්-ආයතනික කරුණු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම;
12. කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සලස්වා දීම හා විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමඟ විද්‍යාඥවරුන් හුවමාරු කරගැනීම; සහ
13. කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන හා අංශ වල කාර්ය සාධනය කලින් කලට සමාලෝචනය කිරීම.

සභාපතිවරයා ගේ වාර්තාව

2020 වර්ෂය එළඹීමෙහි දී ප්‍රතිපත්ති සභාව නව අභිලාෂයක් සහිත ව සිය සේවා කටයුතු ආරම්භ කළේ ය. එහෙත් 2020 මාර්තු මස සිට පැනනැඟුණු කොවිඩ් 19 රෝග ව්‍යාප්තියෙහි බලපෑම කරණ කොට ගෙන සැලසුම් කරන ලද කටයුතු බොහොමයක් අඩපණ විය. කෘෂිකාර්මික පර්යේෂණ, විශේෂයෙන් ම ආහාර සුරක්ෂිතතාව කෙරෙහි එල්ල වූ බලපෑම අතිශයින් බරපතල විය. පැවති මෙම වාතාවරණයට විසඳුමක් ලෙස මෙන් ම රටෙහි කෘෂිකාර්මික සංවර්ධනය යළි අත්කර ගැනීම් වස්, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සංවර්ධනය කළේ කෘෂිකාර්මික අංශයෙහි v- හැඩැති තීව්‍ර ප්‍රතිප්‍රාප්තිය සාක්ෂාත් කර ගැනීම පිණිස ය. රෝග ව්‍යාප්ති තත්ත්වය හේතු කොට ගෙන, කෘෂිකර්මයෙහි ප්‍රධාන අංශ හය ම එනම්, ආහාර භෝග, වැවිලි භෝග, වන වගාව, ධීවර හා ජලජ-ජීවී වගාව, පශු සම්පත් හා කුකුළු පාලනය සහ මල් වගාව සඳහා කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සංවර්ධනය කිරීම පිණිස රටෙහි කෘෂිකාර්මික විද්වතුන් සමඟ පවත්වනු ලැබුයේ අන්තර්ජාලය ආශ්‍රිත අතථ්‍ය රැස්වීම් ය. රටෙහි පොදු ප්‍රතිපත්ති ප්‍රකාශනය වන සෞභාග්‍යයෙහි හා ආශ්චර්යයෙහි දිගු දුර දැකුම සැලකිල්ලට ගනිමින්, ගොවීන් නහාසිටුවීම හා ඔවුන් වගා ව්‍යවසායකයන් බවට පත්කිරීම පෙරදැරි කර ගෙන මෙම පර්යේෂණ ප්‍රමුඛතා සංවර්ධනය කරනු ලැබිණ. කෙටි කාලීන පර්යේෂණ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා අනුගමනය කිරීම උදෙසා, කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා ලේඛනය අදාළ අමාත්‍යාංශවල ප්‍රතිපත්ති සකස් කරන්නන්, විද්‍යාඥවරුන් හා සේවාලාභීන් අතර සංසරණය කරන ලදී.

2020 වර්ෂයෙහි දී, ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම සඳහා, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි ආයතන වෙතින් මෙම කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතාවනට අනුකූල ව පර්යේෂණ යෝජනාවලි කැඳවන ලදී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි සහ කෘෂිකාර්මික/ කෘෂිකර්මයට අදාළ පර්යේෂණ සිදු කෙරෙන ජාතික විශ්ව විද්‍යාල පද්ධතියෙහි කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම පිණිස මෙම වැඩසටහන අරමුදල් සපයයි. වර්තමානයේ දී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හා කෘෂිකර්මයට අදාළ පර්යේෂණ සිදු කරන ජාතික විශ්ව විද්‍යාලවලට අරමුදල් සැපයේ. වර්ෂ 1 සිට 3 දක්වා වන කාල පරිච්ඡේදයක් සඳහා වාර්ෂික ව ව්‍යාපෘති පිරිනමනු ලැබේ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි අදාළ ආයතන හා ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය වෙතින් ඉදිරිපත් කෙරෙන පර්යේෂණ ව්‍යාපෘති යෝජනාවලි, අරමුදල් සැපයීම නිර්දේශ කිරීම උදෙසා, ප්‍රතිපත්ති සභාව තුළ ක්‍රියාත්මක වන ජාතික කමිටු මඟින් තෝරා ගැනෙන බාහිර සමාලෝචකවරුන් විසින් අගැයීමට පාත්‍ර කෙරේ.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්ය භාරය අනුව, කෘෂිකාර්මික පර්යේෂණ ආයතන, අංශ හා ව්‍යාපෘති වල කාර්යසාධනය කලින් කලට සමාලෝචනය කළ යුතු වේ. මේ හා සම්බන්ධ ව, 2020 හි දී, බාහිර සමාලෝචක කණ්ඩායම්වල තාක්ෂණික සහය ලබා ගනිමින්, ප්‍රතිපත්ති සභාව පර්යේෂණ සංවිධාන 04 ක සමාලෝචනය පරිසමාප්ත කර තිබේ. ජාතික උද්භිද විද්‍යා උද්‍යාන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය, ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පර්යේෂණ අංශය සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සමාලෝචනයට බඳුන් කෙරිණ. සමාප්තිකරණයට පෙර, ඔවුන් ගේ නිරීක්ෂණ ලබා ගැනීම පිණිස, සමාලෝචන වාර්තා කෙටුම්පත් අදාළ ආයතනවලට සහ ප්‍රතිපත්ති සභා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. ආයතන විසින් හා ප්‍රතිපත්ති සභා පාලක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අදාළවිවරණ/ ප්‍රකාශ අන්තර්ගත කිරීමෙන් අනතුරු ව, ඒ ඒ සමාලෝචකවරුන් විසින් සමාලෝචන සමාප්ති වාර්තා පිළියෙළ කරනු ලැබිණ. නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස, ආයතන සම්බන්ධ සමාලෝචන සමාප්ති වාර්තා අමාත්‍යාංශවල ඒ හා සම්බන්ධ

ලේකම්වරුන්, අදාළ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අදාළ ආයතන අධ්‍යක්ෂවරුන් සහ භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදි.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය සඳහා වන මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතෙහි,මැලේසියාවෙහි පුත්‍ර විශ්ව විද්‍යාලයයට (09), කේසර්ට්සාර්ට් විශ්ව විද්‍යාලයයට (01) හා පිලිපීන විශ්ව විද්‍යාලයයට (04) ක් ලෙස විදේශීය විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යත්වලාභීන් දහහතර දෙනෙක් ඇතුළත් කරනු ලැබිණ. මෙම ශිෂ්‍යත්වලාභීන් ඇතුළත් කිරීමට අදාළ වන නිසි සම්බන්ධිකරණය ප්‍රතිපත්ති සභාව විසින් සිදු කරන ලදු ව, 2020 වර්ෂය මුළුල්ලේ ම වැඩසටහන අවශ්‍ය වූ අරමුදල් ලබා දීම සහතික කරන ලද හෙයින් ශිෂ්‍යත්වලාභීන් හට නියමිත වූ ගෙවීම් සියල්ල සිදු කරන ලදී. අදාළ විදේශීය විශ්ව විද්‍යාලවල සිය අධ්‍යයන කටයුතු අඛණ්ඩ ව සිදු කර ගෙන යන ශිෂ්‍යත්වලාභීන් ගේ මෙන් ම කොවිඩ් 19 රෝග ව්‍යාප්ති තත්ත්වය හේතු කොට ගෙන ශ්‍රී ලංකාවට පෙරළා පැමිණි ශිෂ්‍යත්වලාභීන් ගේ ප්‍රගතිය ප්‍රතිපත්ති සභාව විසින් අධීක්ෂණය කෙරේ. මෙම ශිෂ්‍යත්වලාභීන් සම්බන්ධ කරුණු සභා පාලක මණ්ඩලය වෙත නියමිත ලෙස වාර්තා කරනු ලැබේ. කොවිඩ් 19 රෝග ව්‍යාප්ති කාලය තුළ දී ශිෂ්‍යත්වලාභීන් 76 දෙන හට ම අවශ්‍ය වූ සම්බන්ධිකරණය ප්‍රතිපත්ති සභාව විසින් සපයනු ලැබිණ.

රටේ ඉහළ පිළිගැනීමක් ඇති,ජ්‍යෙෂ්ඨ වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් සියලුම විද්‍යාත්මක කමිටු මෙම තීරණාත්මක කාල පරිච්ඡේදය තුළ සිය වටිනා කාලය කැප කරමින් මාහැඟි සේවාවක් ඉටුකළහ. නව සාමාන්‍ය තත්ත්වයන් යටතෙහි වුව ද, සියලු ම අන්තරායයන් සමඟ, බොහෝ විද්වත්හු විශාලන යෙදුම, ස්කයිප් වැනි නව සන්නිවේදන තාක්ෂණවේද හරහා සිය අත්දැකීම් හුවමාරු කර ගනිති. විවිධ කමිටුවල සේවා සැපයීම හරහා ලබා දෙන ඔවුන්ගේ මාහැඟි දායකත්වය සභාපති වශයෙන් මම මහත් සේ අගය කරමි.

මෙම තීරණාත්මක කාල සීමාව තුළ ආයතනය නිසි ලෙස කළමනාකරණය කිරීම පිණිස ලබා දුන් සහයෝගය වෙනුවෙන් මම සියලු ම සභා පාලක මණ්ඩල සාමාජිකවරුන්හට මා ගේ කෘතඥතාව පළකරමි. සිය සේවාවන් ඉටු කිරීමෙහි ලා ආයතන අධ්‍යක්ෂ, පර්යේෂණ කළමනාකරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති සභා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥවරුන්, පර්යේෂණ නිලධරයන්, පරිපාලන සහකාර අධ්‍යක්ෂ, කාර්යයෙහි නියුතු ගණකාධිකාරි සහ සියලු ම කාර්යමණ්ඩල සාමාජිකවරුන් සිදු කළ වැඩකටයුතු සම්භාරය හා විශිෂ්ඨ කාර්ය සාධනය අගයකරමින් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

මහාචාර්ය ගාමිණි සේනානායක
සභාපති
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

ලේකම්වරයා ගේ වාර්තාව

1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතට අනුව, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි පැවරුම් කාර්ය භාරයන් වනුයේ.ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය (NARS) තුළ පර්යේෂණ සම්බන්ධීකරණය, මානව සම්පත් සංවර්ධනය,කෘෂිකාර්මික පර්යේෂණ විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීම යි. ආරම්භයෙහි සිට, ප්‍රතිපත්ති සභාව, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියට ආධාර කිරීමෙහි සක්‍රිය ව නිරත ව සිටිමින්, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල විද්‍යාඥවරුන් හට පර්යේෂණ ප්‍රදාන මෙන් ම මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ලබා දීම ද සිදු කරයි. ප්‍රතිපත්ති සභාවේ ප්‍රධානතම කාර්ය පැවරුම වනුයේ, රටෙහි කෘෂිකාර්මික අංශය නඟා සිටුවීම අරභයා පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම යි. 2020 වර්ෂයෙහි දී ප්‍රතිපත්ති සභාව විසින්, කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා නිකුත් කරන ලද්දේ රටෙහි පොදු ප්‍රතිපත්ති ප්‍රකාශනය සැලකිල්ලට ගනිමිනි. කෘෂිකාර්මික අංශයේ විද්වතුන් ගෙන් සැදුම් ලත් ජාතික කමිටු දොළසක් සහා පාලක මණ්ඩලය විසින් ස්ථාපිත කර තිබේ. 2020 වර්ෂය තුළ, අන්තර්ජාලය ආශ්‍රිත අතථ්‍ය රැස්වීම් හරහා ජාතික කමිටු ක්‍රියාත්මක වූයේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුමෙහි පර්යේෂණ යෝජනාවලි අගැයීම පිණිස මෙන් ම කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සංවර්ධනය කිරීම පිණිස ය. මෙම කමිටු ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි නව පර්යේෂණ යෝජනාවලි 32 ක් අගැයීමට බඳුන් කර, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුමෙහි 2021 වර්ෂයෙහි වැඩසටහන සඳහා යෝජනාවලි 29 ක් නිර්දේශ කළහ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි සියලු ම ආයතනවල 2020 වසරෙහි ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීමෙහි දී අනාවරණය වූයේ එම සියලු ම ආයතන ප්‍රතිපත්ති සභාව විසින් ස්ථාපනය කරන ලද පර්යේෂණ ප්‍රමුඛතාවනට අනුකූල වන බව ය. පර්යේෂණ ප්‍රථිපල බෙදාහැරීම පිණිස සහ පර්යේෂණ කරුණු පිළිබඳ ව සාකච්ඡා කිරීම උදෙසා විද්‍යාඥවරුන් හා සේවාලාභීන් වෙනුවෙන් වේදිකාවක් නිර්මාණය කිරීම් වස්, මෙම කමිටු විසින් එක් අතථ්‍ය ජාතික සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබිණ.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි ආයතනවල මානව සම්පත් සංවර්ධනය කිරීම අරභයා අමාත්‍ය මණ්ඩලය අනුමත කළ ධාරිතා බල සංවර්ධන වැඩසටහන අනුව, 2020 වසරෙහි දී තෝරා ගැනීම් තවදුරටත් සිදුකරන ලදු ව, පශ්චාත් උපාධි අධ්‍යයනයන් සඳහා අපේක්ෂකයෝ 16 දෙනෙක් විදේශීය විශ්ව විද්‍යාල වෙත යොමු කරන ලදහ.

ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යයන් අතරින් අතිශයින් ම වැදගත් කාර්යයක් වන්නේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ දත්ත එක් රැස්කිරීම,විශ්ලේෂණය කිරීම සහ පර්යේෂණ දත්ත පදනම් පවත්වා ගැනීම යි. වැවිලි, වැවිලි නොවන, ධීවර, පශු සම්පත්, වන වගාව හා මල් වගාව යන අංශ ආවරණය කෙරෙන විවිධ අමාත්‍යාශයට තේ පර්යේෂණ ආයතන 25 ක පර්යේෂණ කටයුතු සඳහා රජයේ අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ෂිකව වෙන් කරනු ලැබේ. කෘෂිකර්මාන්තයේ මෙම අංශවල පර්යේෂණ සඳහා ජාතික ප්‍රමුඛතා හඳුනාගැනීමේ වගකීම පැවරී ඇති එකම සංවිධානය ප්‍රතිපත්ති සභාව ය. එබැවින්, සුදුසු තීරණ ගැනීමේ දී පර්යේෂණ කළමණාකරුවන්, පර්යේෂකයින් සහ මහා භාණ්ඩාගාරය සඳහා කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කිරීමට පර්යේෂණ තේමාවන් සහ වෙනත් තොරතුරු රැස් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම විශ්ලේෂණය මඟින් රටේ කෘෂිකාර්මික පර්යේෂණ න්‍යාය පත්‍රයේ අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සඳහා පර්යේෂණ කළමනාකරුවන්ට වැදගත් පණිවිඩ රාශියක් ජනනය කර ඇත. මෙම විශ්ලේෂණය, පර්යේෂණ ප්‍රමුඛතා, පර්යේෂණ විෂයයන් සහ වඩාත් ප්‍රයෝජනවත් හා කඩිනම් පර්යේෂණ න්‍යාය පත්‍රයන් සඳහා සම්පත් වෙන් කිරීම සකස් කිරීමේ අවශ්‍යතාව මත පදනම්වූ පර්යේෂණ

වල හිඩැස් හඳුනාගැනීම උදෙසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, භෝග සම්බන්ධ පර්යේෂණ ආයතනවල අධ්‍යක්ෂවරුනට, අදාළ අමාත්‍යාංශ වලට සහ මහා භාණ්ඩාගාරයට උපකාරී වේ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ ආයතන 25 හි 2020 වර්ෂය සඳහා වන පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් ප්‍රතිපත්ති සභාව විසින් විශ්ලේෂණය කරන ලද අතර ඒවායේ ප්‍රගතිය ද අධීක්ෂණය කරන ලදී.

මෙයට අමතර ව, ප්‍රතිපත්ති සභාව විසින් 2020 වසරෙහි දී, බාහිර සමාලෝචන කණ්ඩායම්වල තාක්ෂණික සහයෝගය ලබා ගනිමින්, පර්යේෂණ සංවිධාන 4 ක් සමාලෝචනය කරන ලදී.ජාතික උද්භිද විද්‍යා උද්‍යාන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණඅංශය, ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පර්යේෂණ අංශය සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සමාලෝචනයට බඳුන් කෙරිණ. නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස, ආයතන සම්බන්ධ සමාලෝචන සමාප්ති වාර්තා අමාත්‍යාංශවල ඒ හා සම්බන්ධ ලේකම්වරුන්, අදාළ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අදාළ ආයතන අධ්‍යක්ෂවරුන් සහ භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදි.

අවසාන වශයෙන්, 2020 වසරෙහි බලපැවැත්වූ කොවිඩ් 19 රෝග ව්‍යාප්ති තත්ත්වය තුළ වුව ද ප්‍රතිපත්ති සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා සභාවේ සභාපති, සභා පාලක මණ්ඩල සාමාජිකවරුන්, විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකවරුන්, සියලු ම ජාතික කමිටු සාමාජිකවරුන් සහ ප්‍රතිපත්ති සභාවෙහි කාර්ය මණ්ඩලය වෙහෙස නොබලා ලබා දුන් සහයෝගය වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාව පළ කරමි.

ප්‍රභාත් විමල් කුමාර
ලේකම් / අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

2020 වසර තුළ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ක්‍රියාකාරකම්

කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සකස් කිරීම

ආවරණය කර ඇති පැවරුම් කාර්යය

- කෘෂිකාර්මික පර්යේෂණ සංවිධානය කිරීම, සම්බන්ධීකරණය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන වෙනත් අදාළ කරුණු පිළිබඳව රජයට උපදෙස් දීම (1)

- ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය හා ප්‍රමුඛතා සකස් කිරීම (2)

- ජාතික සංවර්ධන අරමුණු තව දුරටත් ඉදිරියට ගෙන යාමේ අරමුණින් කෘෂිකාර්මික පර්යේෂණ වල සමස්ත අරමුණු හා විෂය පථය නිර්වචනය කිරීම (3)

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සහ රජය අතර සන්නිවේදන මාර්ගයක් ලෙස ක්‍රියාකිරීම (7)

- කෘෂිකාර්මික පර්යේෂණ වලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර්-ආයතනික කරුණු පිළිබඳ සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම (11)

2019 හිදී ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන 25 ක පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම

ප්‍රතිපත්ති සභාවේ වඩාත්ම වැදගත් පැවරුම් කාර්යයක් වන්නේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීමයි. වැවිලි, වැවිලි නොවන, ධීවර, පශු සම්පත්, වන විද්‍යා හා මල් වගාව යන අංශ ආවරණය වන පරිදි ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 25 හි පර්යේෂණ කටයුතු සඳහා රජයේ අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ෂිකව වෙන් කරනු ලැබේ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ ඉහත ක්ෂේත්‍රවල පර්යේෂණ සඳහා ජාතික ප්‍රමුඛතා හඳුනා ගැනීමේ වගකීම පැවරී ඇති එකම සංවිධානය ප්‍රතිපත්ති සභාව ය. එබැවින්, සුදුසු තීරණ ගැනීමේදී පර්යේෂණ නායකයින්, පර්යේෂකයන් සහ භාණ්ඩාගාරය සඳහා කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කිරීමට පර්යේෂණ තේමාවන් සහ වෙනත් තොරතුරු රැස්කිරීම අත්‍යවශ්‍ය වේ. විශ්ලේෂණය අවසන් කර ප්‍රතිපල අර්ථ නිරූපණය කෙරෙමින් පවතී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ 2019 හි කෘෂිකාර්මික පර්යේෂණ තත්ත්ව වාර්තාව අවසාන ප්‍රතිදානයයි. මෙම විශ්ලේෂණය මඟින් රටෙහි කෘෂිකාර්මික පර්යේෂණ න්‍යාය පත්‍රයේ අවශ්‍ය වෙනස්කම්

සිදු කිරීමට සහ පර්යේෂණ ප්‍රමුඛතා, පර්යේෂණ විෂයයන් සඳහා අවශ්‍යතාව මත පදනම් වූ පර්යේෂණවල හිඩැස්/ලුහුඬුතා හඳුනාගැනීම සහ වඩාත් ප්‍රයෝජනවත් හා හදිසි පර්යේෂණ න්‍යාය පත්‍ර කරා සම්පත් වෙන් කිරීම් පිණිස අදාළ අමාත්‍යාංශවලට, අධ්‍යක්ෂ ජනරාල්වරුන් හට, අධ්‍යක්ෂවරුන් හට සහ භාණ්ඩාගාර නායකයන් හට වැදගත් පණිවිඩ රැසක් ජනනය කර ඇත.

ප්‍රතිපත්ති සභාව විසින් කොවිඩ් 19 රෝග ව්‍යාප්තියෙහි බලපෑම එල්ල වූ කෘෂිකාර්මික අංශය වෙනුවෙන් සකස් කළ, 2021 – 2025 වර්ෂ සඳහා වන කෙටි හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා

ප්‍රතිපත්ති සභාවේ ජාතික කමිටු 12 හි සභාපතිවරුන් කැඳවා අන්තර්ජාලය ආශ්‍රිත විශාලන යෙදුම් රැස්වීමක් සංවිධානය කරන ලද්දේ කොවිඩ් 19 රෝග ව්‍යාප්ති තත්ත්වයෙහි බලපෑම් එල්ල වූ ආර්ථිකය යළි නඟාසිටුවීම වෙනුවෙන් පරිශ්‍රම දැරීමේ කඩිනම් අවශ්‍යතාව මතුකර දැක්වීම සඳහා ය. සියලු ම ජාතික කමිටු කැඳවුම්කරුවෝ මෙම රැස්වීමට සහභාගි වූහ. කොවිඩ් 19 රෝගයෙහි බලපෑමට ලක්වූ කෘෂිකාර්මික අංශය වෙනුවෙන් කෙටි කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම මෙම රැස්වීමෙහි අරමුණ විය. කෘෂිකර්මයෙහි ප්‍රධාන අංශ හය ම එනම්, වැවිලි භෝග, වැවිලි නොවන භෝග, වන වගාව, ධීවර හා ජලජ-ජීවී වගාව, පශු සම්පත් හා කුකුළු පාලනය සහ මල් වගාව සඳහා කෙටි කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සකස් කෙරිණ. කෙටි කාලීන පර්යේෂණ ප්‍රමුඛතා ලේඛනය අදාළ සියලු ම අමාත්‍යාංශ වෙත,ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ සියලු ම ආයතන වෙත, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත සහ වෙනත් අදාළ සේවාලාභීන් වෙතබෙදාහරින ලදී.

ප්‍රතිපත්ති සංක්ෂේපය - කෘෂිකාර්මික අංශයෙහි පර්යේෂණ සඳහා ආයෝජනය: අප සත්‍ය වශයෙන් ම කෘෂිකාර්මික පර්යේෂණ ඉලක්කගත කරන්නෙමු ද?

පර්යේෂණ සම්බන්ධ දෙපාර්තමේන්තු හා ආයතන විසින් කෘෂිකාර්මික පර්යේෂණ සඳහා වෙන්කෙරෙන භාණ්ඩාගාර අරමුදල් අවකළමණාකරණය කිරීම, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය මුහුණදෙන ප්‍රධාන අභියෝගයකි. කෘෂිකාර්මික පර්යේෂණ වෙනුවෙන් භාණ්ඩාගාරය මඟින් අඛණ්ඩ ව අරමුදල් වැය කිරීම/ පියවීම, දිගු කාලීන ව බලපෑම් ඇති කළ හැකි කරුණු රාශියකට මුහුණපෑමට හේතු විය හැකි ය. එක් එක් ආයතනයෙහි පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් සුපරීක්ෂාකාරී ලෙස අධීක්ෂණය කිරීම හරහා, මෙම අරමුදල් වැය කිරීම් පලදායී අයුරින් සම්බන්ධීකරණය හා කළමණාකරණය කිරීම අනුසාරයෙන් පර්යේෂණ අරමුදල් අවකළමණාකරණය අඩු කිරීම ද කෘෂිකාර්මික පර්යේෂණයන් හි ප්‍රත්‍යක්ෂ පර්යේෂණ ප්‍රතිසාධන වැඩි කිරීම ද කළ හැකි වනු ඇත. අරමුදල් වැය කිරීම් නිරවද්‍ය කිරීම උදෙසා භාණ්ඩාගාරය වෙත තොරතුරු ප්‍රතිපෝෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

කෘෂිකාර්මික පර්යේෂණ සඳහා වෙන් කෙරෙන අරමුදල් අවකළමණාකරණය නැවැත්වීමට නම්, එම අරමුදල් භාවිතයෙහි යෙදවීම ඉදිරියෙහි දී ප්‍රතිරාමුගත කළ යුතු බවට ප්‍රතිපත්ති සංක්ෂේපය යෝජනා කරයි. පළමුවෙන් ම, රටෙහි ප්‍රමුඛතා මත පදනම් වෙමින්, බහු-විෂයාත්මක පර්යේෂණ කණ්ඩායම් විසින් වාර්ෂික ව, සාක්ෂාත් කර ගත හැකි පර්යේෂණ ප්‍රතිසාධන සහිත පර්යේෂණ යෝජනාවලි සංවර්ධනය කළ යුතු වේ. ඉදිරිපත් වන/ ක්‍රියාත්මක වන ඉතා කුඩා පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව අඩු කිරීම මෙමඟින් කළ හැකි වනු ඇත. දෙවනු ව, ආංශයික පර්යේෂණ ප්‍රමුඛතා මත පදනම් ව, ප්‍රතිපත්ති සභාවේ ආංශයික කමිටු මඟින් අවසාන වශයෙන් නිර්දේශ කෙරෙන පර්යේෂණ යෝජනාවලිවල ක්‍රියාකාරීසැලසුම් අන්තර්ගත විය යුතු ය. තෙවනු ව, එක් එක් පර්යේෂණ ආයෝජනය තුළ අපේක්ෂිත පර්යේෂණ ප්‍රතිසාධනය පිළිබඳ ව සහතික විය යුතු ය. ඉන් අනතුරු ව, පවතින ක්‍රියාපටිපාටිය පිරිපහදුවට භාජනය

කිරීමෙන් පසු කෘෂිකාර්මික පර්යේෂණ සඳහා වෙන් කෙරෙන ආයෝජනය වැඩි කළ යුතු වේ. සිව්වැනි ව, පර්යේෂණ පිටපත් වීම/ පුනර්කරණය අවම කිරීම් වස්, අන්තර්-ආයතනයක, බහු-විෂයාත්මක පර්යේෂණ සහයෝගිතාව ප්‍රවර්ධනය කළ යුතු ය. පස්වැනි ව, කාර්යක්ෂම හා පලදායි පර්යේෂණ කළමණාකරණ ක්‍රියාපටිපාටියක් පවත්වා ගෙන යාම පිණිස නිරන්තර ව පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම ක්‍රියාවෙහි යෙදවිය යුතු ය.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම (NARP) - 2020 වර්ෂය

ශ්‍රී ලංකාවේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම (NARP) යනු ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියෙහි (NARS) කෘෂිකාර්මික පර්යේෂණ සහ ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙහි කෘෂිකාර්මික/ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සැපයීමේ වැඩසටහනයි. මෙම ව්‍යාපෘති සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් නිශ්චිත කාල සීමාවක් සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්ට අනුකූලව ය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්මාන්තය සම්බන්ධ පර්යේෂණ සිදුකරන ජාතික විශ්ව විද්‍යාල සඳහා දැනට අරමුදල් සපයනු ලැබේ. වසර 1 සිට 3 දක්වා වන කාල සීමා සඳහා වාර්ෂිකව ව්‍යාපෘති ප්‍රදානය කරනු ලැබේ.

එළඹෙන වර්ෂය සඳහා නව ව්‍යාපෘති යෝජනාවලි කැඳවීම, භාණ්ඩාගාරය වෙතින් අරමුදල් ලබා දීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම උදෙසා මෙම යෝජනාවලි අගැයීම, ක්‍රියාකාරී පර්යේෂණ ව්‍යාපෘතිවල අර්ධ-වාර්ෂික ප්‍රගතිය අධීක්ෂණය කිරීම, වාර්ෂික ස්ථානීය ප්‍රගති අධීක්ෂණය සහ අවසාන වශයෙන් ව්‍යාපෘතිවල සමාප්ති වාර්තා අගැයීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ප්‍රතිපත්ති සභාව තුළ ක්‍රියාත්මක වන අදාළ ජාතික කමිටු විසින් මෙම ක්‍රියාකාරකම් බොහොමයක් ඉටු කරනු ලැබේ. 2020 වර්ෂයෙහි දී සහ ඉන් ඉදිරියට, මෙම වැඩසටහන සඳහා, පර්යේෂණ යෝජනාවලි කැඳවීමට පෙර යෝජනාවලිවලට අදාළ සංකල්ප පත්‍රිකා කැඳවීම සහ අගැයීමට පාත්‍ර ව තෝරා ගැනෙන සංකල්ප පත්‍රිකා හා සම්බන්ධ පර්යේෂණ යෝජනාවලි පමණක් කැඳවීම වැනි නව ක්‍රියාකාරකම් ප්‍රතිපත්ති සභාව විසින් හඳුන්වා දෙනු ලැබිණ. මෙයට අමතර ව, අදාළ විෂයයෙහි ප්‍රවීනයන් වන බාහිර සමාලෝචකවරුන් දෙදෙනකු විසින් පර්යේෂණ යෝජනාවලි අගැයීම/ සමාලෝචනය කිරීම ද හඳුන්වා දෙන ලදී.

2020 වර්ෂයෙහි දී,ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය සහ ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය වෙතින් සංකල්ප පත්‍රිකා 34 ක් ඉදිරිපත් විය. ප්‍රතිපත්ති සභාව හා අදාළ ජාතික කමිටු විසින් මෙම සංකල්ප පත්‍රිකා අගැයීම සිදු කරනු ලැබිණ. තෝරා ගන්නා ලද සංකල්ප පත්‍රිකා 31 ක් සඳහා යෝජනාවලි කැඳවන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (19), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (6), පොල් පර්යේෂණ ආයතනය (1), තල් පර්යේෂණ ආයතනය (1) සහ විශ්ව විද්‍යාල (4) මෙම පර්යේෂණ යෝජනාවලි 31 ප්‍රතිපත්ති සභාව වෙත ඉදිරිපත් කළේ ය. මෙයට අමතර ව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දෙසැම්බර් මස අග භාගයෙහි දී තවත් යෝජනාවලි 5 ක් ඉදිරිපත් කළේ ය. එක් එක් යෝජනාවලිය, බාහිර සමාලෝචකවරුන් දෙදෙනකු විසින් අගයනු ලැබිණ. සමාලෝචන වාර්තා සහ අන්තර්ජාලය ආශ්‍රිත විශාලන යෙදුම් රැස්වීම් හරහා පවත්වන ලද සාකච්ඡා අනුසාරයෙන් ව්‍යාපෘති 29 ක් අරමුදල් ලබා දීම සඳහා නිර්දේශ කරන ලද්දේ, සමාලෝචකවරුන් විසින් හා විශාලන යෙදුම් රැස්වීම්වල දී යෝජනා කරන ලද සංශෝධන සිදු කිරීමට යටත් ව ය. සමාලෝචකවරුන් ලබා දුන් ලකුණුවලට අනුකූල ව ව්‍යාපෘති ශ්‍රේණිගත කරන ලදී. විශාලන යෙදුම් රැස්වීමෙහි දී ගන්නා ලද තීරණයට සහ සමාලෝචකවරුන් ගේ නිර්දේශවලට අනුව, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයය විසින් ඉදිරිපත් කරන ලද එක් පර්යේෂණ යෝජනාවලියක් ප්‍රතික්ෂෙප විය. කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුමෙහි අයවැය භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කෙරිණ.

2020 වසරෙහි දී ක්‍රියාත්මක වූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 51 ක් (කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 37 ක්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 08 ක් සහ ජාතික විශ්ව විද්‍යාලවල 06 ක්) විය. ප්‍රතිපත්ති සභාව විසින් වෙන්කරන ලද පරිදි, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුමෙහි ව්‍යාපෘති සඳහා නියමිත වූ අරමුදල් ප්‍රධාන ගවේශකවරුන් හට ලබා දීම සිදු නො කරන ලද්දේ කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතු කොට ගෙන රටෙහි පැවති වාතාවරණය කරණ කොට ගෙන ය. එබැවින්, අර්ධ වාර්ෂික ප්‍රගති අධීක්ෂණය හෝ ස්ථානීය ව්‍යාපෘති අධීක්ෂණය හෝසිදු කරනු නො ලැබිණ. සමාප්ති වාර්තා දෙකක් අගැයීමට බඳුන් කරන ලද අතර ඉතිරි සමාප්ති වාර්තා අගැයීමට භාජනය නො කරන ලද්දේ අරමුදල් නො තිබුණු හෙයිනි.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ජාතික කමිටු

i) කෘෂිකාර්මික පෙළවතාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව (NCAB)

රටෙහි පැවති වාතාවරණය හේතු කොට ගෙන 2020 වර්ෂයේදී කමිටු රැස්වීම් නො පැවැත්විණ. කෙසේ වුව ද, කමිටුවේ කළමණාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස අන්තර්ජාලය ආශ්‍රිත හා දුරස්ථ සන්නිවේදන ක්‍රම භාවිත කරන ලදී. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ජයන්ත සේනනායක මහතා කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ නිලධර ලක්ෂික හෙට්ටිආරච්චි මහතා කමිටුවේ ලේකම්/ සම්බන්ධීකාරක ලෙස කටයුතු කළේ ය.

පහත සඳහන් වන අවසන් කරන ලද ව්‍යාපෘති තුන සඳහා සමාප්ති වාර්තා ඉදිරිපත් කරනු ලැබිණ:

1. වී වගාවෙහි ෆොස්ෆරස් පෝෂණය වැඩිදියුණු කිරීම උදෙසා ෆොස්ෆේට් පෙව පොහොරක් සංවර්ධනය කිරීම - කොළඹ විශ්ව විද්‍යාලයය
2. හෙවියා බ්‍රසිලියෙන්සිස්හි රබර් දික්ගැස්වීම් සාධක ජානයෙහි ප්‍රවර්ධක අනුක්‍රම ප්‍රදේශ පිළිබඳ කාර්යබද්ධ විශ්ලේෂණය - ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයය
3. ප්‍රගුණන තාක්ෂණ ක්‍රම හරහා, තෝරා ගන්නා ලද පලතුරු භෝග සඳහා (පැපොල්, පැහිරි සා විශේෂ අන්නාසි ප්‍රභේද) වෛරස-තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිණිසතාක්ෂණවේද සංවර්ධනය කිරීම - ශාක වෛරස හඳුනාගැනීමේ මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

වසර තුළ දී ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙහි (01) සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි (02) ව්‍යාපෘති තුනක් යළි ආරම්භ කරන ලදී.

ii)භෝග වැඩිදියුණු කිරීම හා සශ්‍ය විද්‍යාව පිළිබඳ ජාතික කමිටුව (NCCIA)

කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතු කොට ගෙන සහ ප්‍රාග්ධන අරමුදල් නො තිබීම කරණ කොට ගෙන 2020 වර්ෂයේ දී කමිටු රැස්වීම් නො පැවැත්විණ. පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ අතිරේක අධ්‍යක්ෂ, ආචාර්ය එස්. කේ. වාසලගේ කමිටුවේ සභාපති ලෙස කටයුතු කළ අතර ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය පද්මිණී සී. ගිරිහාගම මහත්මිය කමිටුවේ ලේකම්/සම්බන්ධීකාරක ලෙස සිය සේවය පවත්වා ගෙන ගියා ය.

මෙම වර්ෂය තුළ දී පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය නො කෙරිණ. මෙම වසරෙහි දී සංකල්ප පත්‍රිකා 15 ක් කමිටුව විසින් අගැයීමට පාත්‍ර කරන ලදී. භෝග වැඩිදියුණු කිරීම හා සශ්‍ය විද්‍යාව පිළිබඳ කෙටි කාලීන හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා පෙළගැස්ම සකස් කරනු ලැබිණ.

iii) වන වගාව පිළිබඳ ජාතික කමිටුව

වන වගාව පිළිබඳ ජාතික කමිටුවේ සභාපති හා සම්බන්ධීකාරක / ලේකම් ලෙස පිළිවෙලින් මහාචාර්ය හේමන්ති රණසිංහ මහත්මිය සහ එන්. සී. දවුලගල මහත්මිය කටයුතු කළහ. 2020 වර්ෂයේ දී කමිටුව භෞතික ව රැස්වීම් නො පැවැත්වූ අතර සැලසුම් කරන ලද වැඩමුළු ද කල්දමන ලද්දේ කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතු කොට ගෙන මහජන ඒකරාශි වීම් සීමා කරන ලද බැවිනි. දුරකථනය හා විද්‍යුත් තැපෑල හරහා අතථ්‍ය සාකච්ඡා පැවැත්විණ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුමෙහි, ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙහි පර්යේෂණ ව්‍යාපෘතියක් වන"හෝර්ටන් තැන්නෙහි වනාන්තර මිය යාම කෙරෙහි ජල ඌනතා ආතතිය හා දේශගුණික විපර්යාසවල බලපෑම අධ්‍යයනය කිරීම" සංකල්ප පත්‍රිකාව හා පර්යේෂණ යෝජනාවලිය අගැයීමට බඳුන් කරන ලදී. "හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානයේ මොන්ටේජ් වනාන්තරයේ වන විනාශය සහ පුනර්ජනනීය විභවයන් තක්සේරු කිරීම" යන පර්යේෂණ ව්‍යාපෘතියෙහි සමාප්ති වාර්තාව ඉදිරිපත් කරන ලදු ව අගැයීම සඳහා සූදානම් කර ඇත.

iv) කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ ජාතික කමිටුව

සීමාසහිත බයෝ ෆුඩ්ස් පුද්ගලික සමාගමේ සභාපති ආචාර්ය සරත් රණවීර මහතා සහ එන්. සී. දවුලගල මහත්මිය පිළිවෙලින් කාබනික කෘෂිකර්මය පිළිබඳ ජාතික කමිටුවේ සභාපති සහ සම්බන්ධීකාරක/ ලේකම් ලෙස සිය සේවය ලබා දුන්හ. 2020 වසරෙහි දී කමිටුව භෞතික ව රැස්වීම් නො පැවැත්වූහ. සැලසුම් කරන ලද, කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා වන කාබනික කෘෂිකර්මාන්තය පිළිබඳ පර්යේෂණ වැඩමුළුව ද පසුවට කල්දමන ලද්දේ කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හේතු කොට ගෙන මහජන ඒකරාශි වීම් සීමා කරන ලද බැවිනි. දුරකථනය හා විද්‍යුත් තැපෑල හරහා අතථ්‍ය සාකච්ඡා පැවැත්විණ. සංකල්ප පත්‍රිකා 03 ක් හා පර්යේෂණ යෝජනාවලි 02 ක් අගැයීමට බඳුන් කරන ලදී.

v) කෘෂිකාර්මික යාන්ත්‍රිකකරණය පිළිබඳ ජාතික කමිටුව

ප්‍රතිපත්ති සභාවේ කෘෂිකාර්මික යාන්ත්‍රිකකරණය පිළිබඳ ජාතික කමිටුවේ කාර්යභාරය වන්නේ පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සහ කෘෂිකාර්මික යාන්ත්‍රිකකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමයි. මෙම කමිටුව, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට යාන්ත්‍රිකකරණය පිළිබඳ සුදුසු තාක්ෂණයන් සංවර්ධනය කිරීම හා බෙදා හැරීම සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධානවල නියෝජිතවරුන් ගෙන් සමන්විත වේ. 2020 වසරෙහි දී එක් අතථ්‍ය කමිටු රැස්වීමක් සංවිධානය කරන ලදී. තේ පර්යේෂණ ආයතනයේ ආචාර්ය එම්. ඒ. විජරත්න මහතා කමිටුවේ සභාපති ලෙස කටයුතු කළ අතර ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ නිලධර සමීර දිසානායක මහතා කමිටුවේ ලේකම්/ සම්බන්ධීකාරක ලෙස කටයුතු කළේ ය.

vi)ජලජ සම්පත් පිළිබඳ ජාතික කමිටුව (NCAR)

මොන්ටි රණතුංග මහතා කමිටුවේ සභාපති වශයෙන් ද ආචාර්ය ෆ්‍රැන්ක් නිරංජන් මහතා කමිටුවේ ලේකම්/ සම්බන්ධීකාරක වශයෙන් ද සේවාව ලබා දුන්හ. කෙටි කාලීන හා මධ්‍ය කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම සඳහා වූඅතථ්‍ය රැස්වීම් පැවැත්විණ. ඌන-භාවිත මත්ස්‍ය හා සමුද්‍ර ප්‍රවේණි සම්පත්

සහ ඒවායෙහි වර්ධනය පිළිබඳ කලාපීය වැඩමුළුවෙහි මුද්‍රිත ප්‍රකාශනයෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කර ප්‍රකාශනය මුද්‍රණය කරන ලදී. ආංශයික පර්යේෂණ වැඩසටහන සඳහා වන කෙටි කාලීන පර්යේෂණ ප්‍රමුඛතා හඳුනා ගැනිණ. 2021 හි දී ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් ලබා දීම පිණිස එක් පර්යේෂණ යෝජනාවලියක් අගැයීමට බඳුන් කරන ලදු ව නිර්දේශ කරන ලදී.

vii) මල් වගා පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව (NCFRD)

කමිටුවේ සභාපතිනිය ලෙස ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ෂෙලෝමි ක්‍රිෂ්ණරාජා මහත්මිය සේවය කළ අතර ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සභාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය එස්. එම්. පී. චන්ද්‍රා පද්මිණී මහත්මිය සම්බන්ධීකාරක/ ලේකම් ලෙස සේවය කළා ය. 2020 වසර තුළ දී, ජාතික මල් වගා පර්යේෂණ සම්මන්ත්‍රණය 2020 සංවිධානය කිරීම සහ අතථ්‍ය දහතුන්වන ජාතික මල් වගා පර්යේෂණ සම්මන්ත්‍රණය (13 වන NASFLOR) පැවැත්වීම සම්බන්ධ ව අතථ්‍ය කමිටු රැස්වීම් දෙකක් පවත්වනු ලැබිණ. 2019 ජාතික මල් වගා පර්යේෂණ සම්මන්ත්‍රණයෙහි මුද්‍රිත ප්‍රකාශනය පළකරන ලදී. 2021 හි දී ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් ලබා දීම පිණිස එක් පර්යේෂණ යෝජනාවලියක් අගැයීමට බඳුන් කරන ලදු ව නිර්දේශ කරනු ලැබිණ. රටෙහි මල් වගා අංශය වැඩිදියුණු කිරීම හා අපනයනය වැඩි කිරීම පිණිස වන සිව් අවුරුදු ක්‍රමෝපායය සැලසුම, අපනයන සංවර්ධන මණ්ඩලයෙහි සහයෝගිතාව සහිත ව සංවර්ධනය කරනු ලැබිණ.

viii) පශු සම්පත් හා කුකුළු පාලනය පිළිබඳ ජාතික කමිටුව (NCLP)

කමිටුවේ සභාපතිනිය ලෙස රුහුණ විශ්ව විද්‍යාලයයේ මහාචාර්ය තක්ෂලා සේරසිංහ මහත්මිය සේවය කළ අතර ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ නිලධර සමීර දිසානායක මහතා කමිටුවේ ලේකම්/ සම්බන්ධීකාරක ලෙස සේවය ලබා දුන්නේ ය. පශු සම්පත් අංශය වෙනුවෙන් කෙටි කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම සඳහා වූඅතථ්‍ය රැස්වීම් පැවැත්විණ.2021 හි දී ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් ලබා දීම පිණිස පර්යේෂණ යෝජනාවලි තුනක් අගැයීමට බඳුන් කරන ලදු ව නිර්දේශ කරනු ලැබිණ. අතථ්‍ය රැස්වීම් පැවැත්වීම මඟින් අංශය සඳහා අනාගත පර්යේෂණ සැලසුම් සංවර්ධනය කරන ලදී.

ix) ස්වාභාවික සම්පත් කළමනාකරණය, තිරසාර කෘෂිකර්මාන්තය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික කමිටුව (NCNRMSACC)

කෘෂිකර්මඅමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආචාර්ය අජන්තා ද සිල්වා මහතා කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර කමිටුවේ සම්බන්ධීකාරක/ ලේකම් ලෙස ප්‍රතිපත්ති සභාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණී මහත්මිය කටයුතු කළා ය.2021 හි දී ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම යටතෙහි අරමුදල් ලබා දීම පිණිස පර්යේෂණ යෝජනාවලි හතක් අගැයීමට බඳුන් කරන ලදු ව පහක් නිර්දේශ කරනු ලැබිණ.

x) ශාක ආරක්ෂණය පිළිබඳ ජාතික කමිටුව (NCPP)

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය කීර්ති මොහොට්ටි මහතා කමිටුවේ සභාපති ලෙස ද අතර ප්‍රතිපත්ති සභාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය ශානිකා ජයසේකර මහත්මිය

කමිටුවේ සම්බන්ධීකාරක/ ලේකම් ලෙස කටයුතු කළහ. ශාක ආරක්ෂණය විෂයය යටතෙහි අන්තර්ජාලයික සාකච්ඡා පවත්වන ලද අතර, පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගති අගැයීම්,පර්යේෂණ ප්‍රගතිය සම්බන්ධ ව සකස් කරන ලද ආකෘති පත්‍රයක් අනුසාරයෙන් ඉල්ලා සිටින ලද්දේ කොවිඩ් 19 රෝග ව්‍යාප්ති වාතාවරණය හේතු කොට ගෙන ය. අවසන් කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිවල සමාප්ති වාර්තා ප්‍රධාන ගවේශකවරුන් වෙතින් ලබා ගන්නා ලදී. ශාක ආරක්ෂණය සම්බන්ධ පර්යේෂණ ප්‍රතිදාන සාරාංශ එක්රැස් කිරීම සඳහා වූ පර්යේෂණ ප්‍රතිදාන ආකෘති පත්‍රයක් සකස් කරනු ලැබිණ. ප්‍රතිපත්තිමය සංක්ෂිප්තයක් සම්පාදනය කිරීම අරභයා ශාක ආරක්ෂණය සම්බන්ධ පර්යේෂණ ප්‍රතිපත්ති හා පළිබෝධනාශක භාවිතය පිළිබඳ ප්‍රකාශන පිරික්සුමක් සිදු කරන ලදී. 2020 හි දී නව පර්යේෂණ යෝජනාවලි දෙකක් ඉදිරිපත් කරන ලද අතර 2021 හි දී අරමුදල් ලබා දීම පිණිස එම ව්‍යාපෘති යෝජනාවලි අගැයීමට බඳුන් කරන ලදී. ශාක ආරක්ෂණය පිළිබඳ කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගුකාලීන පර්යේෂණ ප්‍රමුඛතා සකස් කෙරිණ.

xi) පශ්චාත් අස්වනු තාක්ෂණය හා මානව පෝෂණය පිළිබඳ ජාතික කමිටුව (NCPTHN)

කමිටුවේ සභාපති ලෙස ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහකාර නියෝජිත, ආචාර්ය ඩී. බී. ටී. විජෙරත්න මහතා කටයුතු කළ අතර ප්‍රතිපත්ති සභාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය ශානිකා ජයසේකර මහත්මිය කමිටුවේ සම්බන්ධීකාරක/ ලේකම් ලෙස සේවය කළා ය.කොවිඩ් 19 රෝග ව්‍යාප්ති වාතාවරණය හේතු කොට ගෙන අන්තර්ජාලයික සාකච්ඡා පවත්වන ලද අතර, පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගති අගැයීම්, පර්යේෂණ ප්‍රගතිය සම්බන්ධ ව සකස් කරන ලද ආකෘති පත්‍රයක් අනුසාරයෙන් ඉල්ලා සිටින ලදී. 2020 හි දී නව පර්යේෂණ යෝජනාවලි පහක් ඉදිරිපත් කරන ලද අතර 2021 හි දී අරමුදල් ලබා දීම පිණිස එම ව්‍යාපෘති යෝජනාවලි අගැයීමට බඳුන් කරන ලදී. පශ්චාත් අස්වනු තාක්ෂණය හා මානව පෝෂණය පිළිබඳ කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සකස් කෙරිණ.

xii) සමාජ-ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ ජාතික කමිටුව (NCSEPA)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සමාජ ආර්ථික සැලසුම් මධ්‍යස්ථානයේ ප්‍රධානී ආචාර්ය ආර්. එම්. හේරත් මහතා කමිටුවේ සභාපති ලෙස සේවය අතර කමිටුවේ සම්බන්ධීකාරක/ ලේකම් ලෙස ප්‍රතිපත්ති සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ කළමනාකරණ) ආචාර්ය ෆ්‍රැන්ක් නිරන්ජන් මහතා කටයුතු කළේ ය. කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන පර්යේෂණ ප්‍රමුඛතා සකස් කිරීම පිණිස වර්ෂය තුළ දී අතථ්‍ය කමිටු රැස්වීම් පවත්වනු ලැබිණ.

2020 වර්ෂය තුළ පවත්වන ලද වැඩමුළුසහ සම්මේලන





මල් වගා පර්යේෂණ පිළිබඳ 13 වන ජාතික සම්මේලනය 2020 (NASFLOR 13- 2020)

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින්, මෙම ක්ෂේත්‍රයේ මෑත කාලීන පර්යේෂණ සොයාගැනීම් මතු කර දැක්වීම සහ ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා,2020 දෙසැම්බර් මස 11 වන දින, අතථ්‍ය සම්මේලනයක් ලෙස මල් වගා පර්යේෂණ පිළිබඳ වාර්ෂික ජාතික සම්මේලනය (NASFLOR-2020) සංවිධානය කරන ලදී. පර්යේෂකවරු, වගාකරුවෝ, අපනයනකරුවෝ සහ ප්‍රතිපත්ති සම්පාදකවරු සම්මේලනයට සහභාගී වූ අතර මෙම අංශය සංවර්ධනය කිරීම අරභයා ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කර ගත්හ. මල් වගා අංශයට අදාළ පර්යේෂණ පත්‍රිකා 16 ක් පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලද අතර එම පත්‍රිකා වර්ගහයකට කාණ්ඩගත කර ඇත.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ භාවිතයට ගත නො හැකි භාණ්ඩ බැහැර කිරීම සඳහා 2020 මහජන වෙන්දේසිය

සභා පාලක මණ්ඩලයෙහි වාර්ෂික සත්‍යාපන කමිටුව විසින් හඳුනා ගනු ලැබූ, භාවිතයට ගත නො හැකි භාණ්ඩ බැහැර කිරීම සඳහා 2020දෙසැම්බර් මාසයෙහි දී ප්‍රතිපත්ති සභාව විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වන ලදී.

කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය

ආවරණය කර ඇති පැවරුම් කාර්යභාරය

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවලට අවශ්‍ය වන මූල්‍ය, මිනිස්බල හා භෞතික සම්පත් පිළිබඳ ව සුදුසු බලධාරීත්වයනට නිර්දේශ ඉදිරිපත් කිරීම (4)

- ආයතනයික හා දෙපාර්තමේන්තු කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් සමාලෝචනය කිරීම සහ එම ආයතනවල ප්‍රමුඛතා හා අරමුදල් සැපයීම සම්බන්ධයෙන් සහ මුදල් හා ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා ගේ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම (5)

- කෘෂිකාර්මික පර්යේෂණ ආයතන, අංශ,සහ ව්‍යාපෘතිවල කාර්යසාධනය වරින් වර සමාලෝචනය කිරීම (13)

කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු (INFORM)

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ආයතන 13 ක් එනම්,පොල් පර්යේෂණ ආයතනය (CRI), තල් පර්යේෂණ ආයතනය (PRI), රබර් පර්යේෂණ ආයතනය (RRI), උක් පර්යේෂණ ආයතනය (SRI), තේ පර්යේෂණ ආයතනය (TRI), පශු පර්යේෂණ ආයතනය (VRI), ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායනය (NARA), පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය (IPHT), හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) , ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව (DNBG), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව(DFC), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DEA) සහ උප ආයතන 19 ක් ඇතුළු ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA)වෙතින් ප්‍රතිපත්ති සහාව වාර්ෂික ව, විද්‍යුත් ආකෘතියක් තුළ, පර්යේෂණ නිලධරයන්, පර්යේෂණ ව්‍යාපෘති සහ පුනරාවර්තන පර්යේෂණ අයවැය පිළිබඳ ගෙවුණු වර්ෂයට සම්බන්ධ තොරතුරු එක්රැස් කරයි.

2020 වර්ෂය තුළ දී, ආයතන 12 ක් (පොල් පර්යේෂණ ආයතනය CRI, තල් පර්යේෂණ ආයතනය PRI, රබර් පර්යේෂණ ආයතනය RRI, උක් පර්යේෂණ ආයතනය SRI, තේ පර්යේෂණ ආයතනය TRI, පශු පර්යේෂණ ආයතනය VRI, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායනය NARA, පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය IPHT, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය HARTI, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව DNBG, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව DFC, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව DEA)වෙතින් සහ උප ආයතන 19 ක් (ක්ෂෙත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය FCRDI, පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය FRDI, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය HORDI, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය RRDI, සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය SEPC, ප්‍රාදෙශීය කෘෂිකර්ම පර්යේෂණහා සංවර්ධනමධ්‍යස්ථානය- අරලගංවිල RARDC-AR, ප්‍රාදෙශීය කෘෂිකර්ම පර්යේෂණහා සංවර්ධනමධ්‍යස්ථානය- බණ්ඩාරවෙල RARDC-BN, ප්‍රාදෙශීය කෘෂිකර්ම පර්යේෂණහා සංවර්ධනමධ්‍යස්ථානය- බෝඹුවෙල RARDC-BW, ප්‍රාදෙශීය කෘෂිකර්ම පර්යේෂණහා සංවර්ධනමධ්‍යස්ථානය- මාකඳුර RARDC-MK, ප්‍රාදෙශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන

මධ්‍යස්ථානය- අඟුණුකොළපැලැස්ස RARDC-ANK, ප්‍රාදෙශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය- කිලිනොච්චි RARDC-KC,ශාක ජාන සම්පත් මධ්‍යස්ථානය PGRC, ශාක වෛරස හඳුනාගැනීමේ මධ්‍යස්ථානය PVIC, ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය NRMC, ජාතික ශාක නිරෝධායන සේවය NPQS, ගොවිපොළ යාන්ත්‍රිකරණ පර්යේෂණ මධ්‍යස්ථානය FMRC,ආහාර පර්යේෂණ ඒකකය FRU, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයය ROP , බීජ සහතික කිරීමේ සේවය SCS)වෙතින් 2019 වසර පිළිබඳ තාත්වික දත්ත සම්බන්ධ තොරතුරු ඉල්ලා සිටින ලදී. 2020 වසරෙහි දී දත්ත පදනම් තිස් එකක් එකතු කිරීමට අපේක්ෂා කළ අතර තිහක් එකතු කරන ලදී. උක් පර්යේෂණ ආයතනයෙහි දත්ත පදනම නො ලැබුණි. එක්රැස් කරන ලද දත්ත පදනම් සකස් කර,පිරිපහදු කර යළි අදාළ ආයතනයවලට ඉදිරිපත් කෙරිණ. සකස් කරන ලද මෙම දත්ත පදනම් ඉන්ෆෝර්ම් - 2019 ජාතික දත්ත පදනම ලෙස සම්පාදනය කෙරිණ. ඉන්ෆෝර්ම් - 2019 ජාතික දත්ත පදනම වෙතින් ප්‍රතිග්‍රහණය කරන ලද වැදගත් තොරතුරු ප්‍රතිපත්ති සභා වෙබ් අඩවියෙහි රැඳවුම්ගත කරන ලදී.

කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය මත රටෙහි පැවති වාතාවරණය ද අරමුදල් නොමැති වීම ද කරණ කොට ගෙන 2020 වසරෙහි දී ඉන්ෆෝර්ම් පුහුණු කිරීමේ වැඩසටහන් නො පවත්වන ලදී.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනය (ICTA) සමඟ එක් ව, තථ්‍ය කාල පිළිබඳ තොරතුරු සැපයීම පිණිස ඉන්ෆෝර්ම් - 2019 ජාතික දත්ත පදනම ප්‍රතිසංස්කරණය කිරීමෙහි හා වැඩිදියුණු කිරීමෙහි කටයුතු ආරම්භ කරනු ලැබිණ.

පර්යේෂණ ආයතන පිළිබඳ බාහිර සමාලෝචනය - 2020

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි එක් පැවරුම් කාර්ය භාරයක් (1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත) වනුයේ, කෘෂිකාර්මික පර්යේෂණ ආයතන, අංශ, සහ ව්‍යාපෘතිවල කාර්යසාධනය වරින් වර සමාලෝචනය කිරීම (13) යි.

